DWC/05/07/01-Sea Mammals 23 .05.2013

ලේකම්,
වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

**2012 අංක 01 දරණ මුහුදු ක්ෂීරපායි සතුන් (නිරීක්ෂණ, නියාමන සහ පාලන) නියෝග සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ මඟින් මා වෙත යොමු කල රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/ DEF/ 03/02/GEN/06 හා 2013 අප්‍රේල් මස 16 දිනැති ලිපිය කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. ඉහත කරුණ සම්බන්ධයෙන් 2012 සැප්තැම්බර් මස 06 දින අංක 1774 /27 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සියලුම කරුණු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, නාවික හමුදාව, පොලීසිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නාරා ආයතනය, හා ධීවර දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය ආයතන කිහිපයක සහ ප්‍රධාන පෙළේ සංචාරක ආයතන කිපයක සහභාගීත්වයෙන් කීපවරක් සාකච්ජා කර සකස්කල ඒවා වන අතර, එහි මූලික ආයතනය වශයෙන් වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමේ බලතල ඇති එකම ආයතනය වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකර ඇත. තවද නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ලෙස පොලිසියද නම් කෙරිණි.

03. කෙසේ වුවද නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවද බලයලත් නිලධාරීන් වශයෙන් සඳහන් වූ අතර, සාගරයේ සිදුවන සෑම කටයුත්තකදීම එම ආයතන දෙකට පරීක්ෂා කිරීමේ බලය නිතැතින්ම හිමිවේ.

04. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමේ බලතල (469 වන අධිකාරි බලය) හිමිව ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බැවින් එම පනතේ 30 වන වගන්තිය ප්‍රකාර රෙගුලාසි සකස්කර ගැසට් කර ඇත. මේ නිසා පනත සංශෝධනය වීමකින් තොරව උක්ත අංක දරණ ලිපියේ සඳහන් 6 (1) පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කල නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

05. නමුත් ගැසට් පත්‍රයේ 111 වන උපලේඛනයෙහි 17 වන ඡේදයෙහි සඳහන් බලයලත් නිලධාරීන් කාණ්ඩයට සාගරයේ රාජකාරි සිදු කරන නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුලත් බවද කවදුරටත් දන්වා සිටිමි.

එච්.ඩී.රත්නායක,
අධ්‍යක්ෂ ජනරාල්

O/C

**III වන උපලේඛනය**

බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි පහත දැක්වේ –

1. යාත්‍රාව අයිතිකරු හෝ ක්‍රියාකරු වෙත නිකුත් කරන ලද බලපත්‍රය අන්සතු කළ නොහැක.
2. යාත්‍රාව යම් නිශ්චිත යාත්‍රාංගනයක සිට ගමන ආරම්භ කළ යුතු අතර එම යාත්‍රාංගනයටම ආපසු පැමිණිය යුතු ය.
3. සෑම යාත්‍රාවක් ම මීටර් 50ක් දුර සිට එම යාත්‍රාවේ අංකය නිරීක්ෂණය කළ හැකි පරිදි එම අංකය යාත්‍රාවේ ලියා තිබිය යුතු ය.
4. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා දිනපතා පෙ.ව. 5.30 සිට ප.ව. 7.00 දක්වා අවසර දෙනු ලැබේ.
5. මුහුදු ක්ෂීරපායි සතුන් දර්ශනය වූ විට, එහි සිට යාත්‍රාවට ඇති දුර ප්‍රමාණය මීටර් 400 වන තෙක් යාත්‍රාවේ වේගය ක්‍රමක්‍රමයෙන් අඩුකල යුතු ය. තල්මසුන් සම්බන්ධයෙන් වන විට තල්මසුන් සිටින ස්ථානයේ සිට මීටර් 100ක් දුරින් යාත්‍රාව නවතා එහි ඇන්ජිම ක්‍රියා විරහිත කළ යුතු ය. කිසිදු අවස්ථාවක තල්මසුන් සිටින ස්ථානයේ සිට යාත්‍රාවට ඇති දුර මීටර් 100කට වඩා ආසන්න නොවිය යුතු ය. වෙනත් ක්ෂීරපායී සතුන් සම්බන්ධයෙන් එම සතුන් සිටින ස්ථානයේ සිට මීටර් 50කට වඩා අඩු දුර ප්‍රමාණයකට යාත්‍රාව ළඟා නොවිය යුතු ය.
6. යාත්‍රාව ස්වකීය වේගය හෝ දිසාව හිටිහැටියේ වෙනස් නොකළ යුතු ය. ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය කරන විට එම සතුන්ගේ ඉදිරියෙන් හෝ පිටුපසින් යාත්‍රා ගමන් නොකළ යුතු අතර එම සතුන්ගේ ගමන් මාර්ගය අවහිර වන පරිදි කිසිදු අවස්ථාවක යාත්‍රාව ගමන් නොකරන බවට වග බලාගත යුතු ය.
7. මුහුදු ක්ෂීරපායි සතුන් යාත්‍රාව කෙරෙහි අද්දා ගැනීම සඳහා හෝ ඔවුන් ඒ ආසන්නයට ගෙන්වා ගැනීමට පෙළඹවීම සඳහා එම සතුන් සඳහා කිසිදු කෘත්‍රිම ආහාර ද්‍රව්‍යයක් ලබා දීම හෝ ආලෝක සහ ශබ්ද තරංග සහ සතුන් ආකර්ශනය කිරීමේ වෙනත් ක්‍රමයක් හෝ භාවිතා නොකළ යුතු ය.
8. මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මගීන් රැගෙන යන යාත්‍රාවක් තුළ සෑම විට ම ලියාපදිංචි මාර්ගෝපදේශයකු සිටිය යුතු ය.
9. යාත්‍රාව ක්‍රියා කරවන තැනැත්තන් හෝ යාත්‍රාවේ මගීන් යාත්‍රාව තුල මත්පැන් රැගෙන නොයා යුතු ය. එසේම යාත්‍රාවට නගින අවස්ථාවේ එකී කවර හෝ තැනැත්තකු මත්පැන් පානය කොට නොතිබිය යුතු ය.
10. ඉහත කී කොන්දේසි වලට අමතරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කළ සඳහන් කරනු ලබන වෙනත් කොන්දේසිවලට ද බලපත්‍රලාභියා යටත් වන්නේය.
11. යාත්‍රාවේ ක්‍රියාකරුවන් හෝ මාර්ගෝපදේශකයන් හෝ මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මගීන් රැගෙන යන තැනැත්තන් හෝ මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා නොකල යුතු ය.
12. මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීමේ යෙදී සිටින තැනැත්තන්ට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු, කිමිදීම හැර, මුහුදට බැසීමට හෝ එකී ක්ෂීරපායී සතුන්ට හානි කරන වෙනත් දෙයක් සිදු කිරීමට හෝ ඉඩ නොදිය යුතු ය.
13. මුහුදු ක්ෂීරපායි සතුන් නැරඹීම සඳහා මුහුදට යන විට ධීවර කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට බාධා නොකල යුතු ය.
14. යාත්‍රාවේ සිටින තැනැත්තන්ට ගොඩබිම සමග සම්බන්ධතා පැවැත්විය හැකි පරිදි යාත්‍රාව තුළ සංනිවේදන උපකරණ තිබිය යුතු අතර යාත්‍රාවේ ජී.පී.එස්. උපකරණය තිබිය යුතු ය.
15. යාත්‍රාවේ යම් කාර්මික දෝෂයක් ඇති වුවහොත් හෝ යාත්‍රාවට වෙනත් හදිසි තත්ත්වයකට මුහුණ දීමට සිදු වුවහොත් එම කාරණා කරුණු සංනිවේදන උපකරණ හරහා ගොඩබිමේ ඇති යාත්‍රාංගනය වෙත හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාවට / ශ්‍රී ලංකා පොලීසියට දැනුම් දිය යුතු ය.
16. අයහපත් කාලගුණය පවතින විට මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා යාත්‍රාව මුහුදට නොයා යුතු ය. අයහපත් කාලගුණික තත්ත්වයන් පවත්නා විට යාත්‍රාව වහාම ගොඩබිම කරා පැමිණිය යුතු ය.
17. වනජීවී නිලධරයෙකුහට හෝ බලයලත් නිලධරයෙකුහට යම් අවස්ථාවක යාත්‍රාව පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් කිසිදු විරෝධතාවයකින් තොරව එසේ කිරීමට අවකාශ දිය යුතු ය.
18. ඉහත සඳහන් කොන්දේසි වලින් එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ කඩ කරනු ලැබුවහොත් එමගින් යාත්‍රාවේ බලපත්‍රය අවලංගු කිරීමේ ප්‍රතිඵලය ඇතිවිය හැකි ය.

එම්.ටී. අසංක ගුණවර්ධන

උද්‍යාන භාරකරු

හික්කඩුව ජාතික උද්‍යානය